**නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් - 2017**

-----------------------------------------------------------------

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ්හි 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදි. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

සමාගම පිහිටි භූමිය වෙනුවෙන් 2012 දී වසර 30 ක බදු කාලයක් සඳහා බදු වාරිකය ලෙස රු.112,000,000 ක් සමාගම විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව සමඟ සංසන්දනාත්මකව, වෙනස්වීමක් පැවතුණහොත් එම වෙනස්වීම ඕනෑම පාර්ශවයක් විසින් පියවීම යන පදනම මත, අභ්‍යන්තර තක්සේරු කමිටුවක තක්සේරුවක් මත පදනම් වෙමින් බදු වාරිකය ගෙවා තිබූ අතර අභ්‍යන්තර තක්සේරුව හා එම භූමිය බදු ඉඩමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එහෙත්, මේ සම්බන්ධයෙන් වන බදු ගිවිසුමකට සමාගම හා නාගරික සංවර්ධන

අධිකාරිය විසින් මෙම වාර්තාවේ දිනය දක්වාද එළඹ නොතිබුණි. තවද, මෙම භූමියෙහි බදු කාලය වසර 30 ක් වුවද, එහි ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ආර්ථික ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 50 ක් ලෙස සැළකිල්ලට ගෙන ඇත.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මඟින් ඉල්ලීම් කර ඇති පරිදි පහත කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණන විෂය පථය සහ සීමාවන් ඉහත දැක්වූ පරිදි වේ.

(ආ) මාගේ මතය අනුව:

- තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.416,276,107 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.88,976,022 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.505,252,129 ක පිරිහීමක් නිරීක්ෂණය විය.පාඨමාලා ගාස්තු ආදායම රු.981,716,959 කින් වැඩි වුවද, වැටුප් වැඩිවීම, වෙළඳ ප්‍රචාරණය, ක්ෂයවීම් හා පොළී වියදම් හා විදේශ ප්‍රේෂණයන් රු.1,421,694,053 කින් සමුච්චිත වීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී බදු පෙර ශුද්ධ ලාභය අඩු වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී, 2015 වර්ෂය සඳහා රු.377,123,442 ක් වූ එකතු කළ අගය 2016 වර්ෂයේදී රු.1,059,099,611 කින් අඩුවීමක් පෙන්නුම් කළ අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් එය රු.210,780,232 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**.4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

සමාගම විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් පිළිබඳව වාර්ෂික ඉලක්ක සකස් කර නොමැති අතර සමාගමේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ භෞතික හා මූල්‍යමය ඉලක්කයක් පෙන්නුම් කරන, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

(අ) වාර්ෂික ඉලක්ක ලබාදී නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක හා තත්‍ය කාර්යසාධනය සංසන්දනය කිරීමට නොහැකි විය.

(ආ) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී වෙළඳ දැන්වීම් සඳහා රු.119,962,476 ක වියදමක් දරා තිබුණද, විදේශීය ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා කිසිදු ප්‍රචාරණයක් සිදු කර නොතිබුණි.

(ඇ) ලැබී ඇති තොරතුරුවලට අනුව, උපාධිධාරීන් හා පශ්චාත් උපාධිධාරීන් වෙත සහතික පත් 6,363 ක් ප්‍රදානය කර තිබුණි. සමාගම ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා, 13,062 ක් වූ මුළු ලියාපදිංචි ශිෂ්‍යයන්ගෙන් 730 ක්, එනම්, සියයට 5 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

**4.2 වත්කම් උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉංජිනේරු අධ්‍යයන පීඨය ශිෂ්‍යයන් 684 දෙනෙකුට පමණ පහසුකම් සැපයීමේ හැකියාවෙන් යුක්තව, නිර්මාණ මැදිරි 02 කින්, දේශන ශාලා 06 කින්, පරිගණක විද්‍යාගාර 06 කින් සමන්විත වුවද, 2018 සැප්තැම්බර් 30 දිනට අධ්‍යයන කටයුතුවල නිරත වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 182 ක් පමණක් විය.

(ආ) ශිෂ්‍ය නේවාසිකාගාරයේ ඇති කාමර 250 න්, විදේශීය ශිෂ්‍යයන් සඳහා වෙන් කර තිබූ වායු සමීකරණය කරන ලද කාමර 23 විද්‍යායතනය ආරම්භයෙන් පසුව උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අගය එකතු කිරීම් හා එක් එක් අයිතම ඉවත් කිරීම් ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් ක්‍රමවත්ව යාවත්කාලීන කර නොතිබුණු අතර සමාගමේ එක් එක් අංශය මගින් ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) අපහරණය කළ හැකි අයිතම ලෙස භාණ්ඩ සමීක්ෂණ කමිටුව විසින් හඳුනාගන්නා ලද අයිතම 2018 සැප්තැම්බර් 30 දිනය වන විටත් අපහරණය කර නොතිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ තථ්‍ය කාර්ය මණ්ඩලය 156 ක් විය. නමුත්, සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් ලබා දී නොමැති අතර සමාගම විසින්, සමාගමේ ක්‍රියාකාරකම් හා ධාරිතාවය හඳුනාගැනීම මගින් තනතුරු සංඛ්‍යාව තීරණය කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත, අදාළ අමාත්‍යාංශය විසින් බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර නොතිබුණි.

(ඇ) 2016 අගෝස්තු මස සිට අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සියයට 50 ක වැටුප් වර්ධකයක්, 2016 අගෝස්තු 18 වන දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. නමුත් 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 9.7 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සීමාවන් ඉක්මවා සමහර නිලධාරීන්ට අත්තිකාරම් ලබාදී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

## 5.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 4.2.1 ඡේදය ප්‍රකාරව මාර්ගෝපදේශයන්හි දැක්වෙන ආකෘතිය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

සමාගමේ නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| මානව සම්පත් කළමණාකරණය | කාර්ය මණ්ඩල තනතුරු හඳුනාගෙන අනුමත කරගෙන නොතිබුණි. |
| වත්කම් කළමණාකරණය | ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබීම හා ඌන උපයෝජනය හා නිෂ්ක්‍රීය වත්කම් නිරීක්ෂණය විය. |